## කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 10 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවතවා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂයන් සමාන වියයුතු වුවද එකී ගිණුම් ශේෂයන් අතර රු.15,758,329 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2009 වර්ෂයේදී රු.1,200,000 කට තක්සේරු කරන ලද බැකෝ යන්ත්‍රයේ වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සේවක ඇප තැන්පත් සඳහා වූ පොලිය රු.27,426 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඈ) පහත සඳහන් ජර්නල් සටහන් මගින් ඒ ඒ ගිණුම් හර හා බැර කර ඇති බව දක්වා ඇතත් පොදු ලෙජරයේ එලෙසට සටහන් වී නොතිබුණි.

| ජර්නල් සටහන් අංකය | ගිණුම | ලෙජර් පිටුව | හර | බැර |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 05 | ලැබිය යුතු මුද්දර ගාස්තු | 30 | 3,438,822 | - |
| | මුද්දර ගාස්තු ගිණුම | | - | 3,438,822 |
| 08 | ප්‍රාග්ධන වියදම් | | 83,145 | - |
| 09 | හිඟකුලී බදු | 07 | 1,440,175 | - |

(ඉ) සමාලෝචිත වර්ෂයට උසාවි දඩ වෙනුවෙන් ප්‍රතිපාදන ඇතිකිරීම සඳහා ජර්නල් සටහන් අංක 06 මගින් රු.204,508 ක් වූ ලැබිය යුතු උසාවි දඩ, එම ගිණුම හර කරනු වෙනුවට බැරකර තිබුණි. තවද ජර්නල් සටහන් අංක 13 මගින් සමාලෝචිත වර්ෂය සඳහා ණයගැත ප්‍රතිපාදන ඇති කිරීම වෙනුවෙන් විවිධ ණයගැති හා ප්‍රාග්ධන ගිණුම් අතර හර හා බැර කල අගයන් දක්වා නොතිබුණි.

(ඊ) සමාලොචිත වර්ෂයේ ලෙජරයේ ආරම්භක ශේෂ ගිණුම්ගත කිරීමේදී ආරම්භක ජර්නල් සටහන් මගින් ගිණුම් තැබීම සිදුකර නොතිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 10 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.75,027,961 ක් වූ අතර උපයෝගී ලේඛණ හා විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.67,060,653 ක් වූයෙන් රු.7,967,308 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ නිරවුල් නොකල රු.1,283,140 ක බැර ශේෂයක් විය.

1.3.4 ගෙවිය යුතු ගිණුම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,560.675 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම.

ගිණුම් විෂයයන් 13 කට අයත් රු.65,821,668 ක් වටිනා ශේෂයන් සඳහා ස්ථාවර වත්කම් ලේඛණ හා සමීක්ෂණ මණ්ඩල වාර්තා, උපලේඛණ, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම් ආදිය නොමැතිකමින් එකී විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 17 | ප්‍රා.ස.21 ආකෘතිය පරිදි උපපත්‍රිකා පිළිබඳව තොරතුරු ඇතුලත් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ii) රීති 145 | එක් එක් තැන්පතු වර්ගය වෙනුවෙන් ඇති මුදල් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් එක් එක් වර්ෂය අවසානයේ පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (iii) රීති 217, 218 | සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 396 | මාස 06 කල් ඉකුත් වූ අගය රු.1,598 ක් වූ චෙක්පත් 3 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 507 | අතැති තොග වල අගය වාර්ෂිකව ගිණුම් වල ඇතුලත් කිරිම සඳහා වර්ෂය අවසන් දිනට භෞතිකව සත්‍යාක්ෂණය කර නොතිබූ අතර ස්ථාවර වත්කම් වල පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2005 මාර්තු 13 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය - 11.5 ජේදය. | නිලධාරීන් තිදෙනෙකුට ගෙවා තිබූ දේපල ණය සඳහා බැංකු ණය පොලී අනුපාතිකය හා නිලධාරියාගෙන් අයකරන 4% පොලිය අතර වෙනස වූ රු.344,098 ක මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණ. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි2002/2 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණයක් නඩතතු කල යුතු වුවද පරිගණක 02 ක් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,419,132 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 945,602 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් ඇතුළු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 03 දිනැති මාගේ ලිපියට අනුව නියමිත අකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු නිරවද්‍ය නොවන බැව් විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශය අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | 2010 | 2009 | % |
| | රු. | රු. | |
| | '000 | '000 | |
| වරිපනම් | 804 | 592 | 35.81 |
| අක්කර බදු | 192 | 169 | 13.61 |
| බදු කුලී | 2.176 | 1. 497 | 45.36 |
| බලපත්‍ර ගාස්තු | 208 | 102 | 103.92 |
| වෙනත් | 31.869 | 20.323 | 56.81 |

2.2.2 හිඟ බදු ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාල අයවිය යුතු රු.995,304 ක බදු ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ප්‍රචාරක දැන්වීම් - දෘශ්‍ය පරිසරය.

(i) 2010 මාර්තු 19 දිනැති අංක 1646 දරන ගැසට් පත්‍රයේ නිකුත් කළ නිවේදනය පරිදි සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය වෙමින් පැවති ප්‍රචාරක දැන්වීම් 38 කින් රු.108,729 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රචාරක ගාස්තු අයකිරීමේදී අතුරු ව්‍යවස්ථාවේ 39.2, 39.3, 39.4, 39.5 වගන්තීන්ට අනුව කටයුතු කර නොතිබූ අතර එකී වගන්තින්ට පටහැනිවීමේදී 39.15 පරිදි කටයුතු කිරීමද සිදුව නොතබුණි.

2.2.4 දුරකථන/විදුලි සංදේශ කුළුණු ගාස්තු.

සභා බල ප්‍රදේශයේ දුරකථන/විදුලි සංදේශ කුළුණු ඉදිකිරීමේදී නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයාගේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් පත්‍රයේ නිකුත් කරන ලද “V” උපලේඛණයේ 6 (ii) පරිදි පෙරසැර ගාස්තු රු.61,687 ක අඩුවෙන්ද, 6(V) ජේදය පරිදි ආවරණ අනුමැතිය දීමේදී කුළුණු 03 කින් රු.200,000 ක්ද 7(V) ජේදය පරිදි කුළුණු 07 ක් සඳහා අනුකුලතා නිකුත් නොකිරීම හේතුවෙන් අයවිය යුතු රු.29,000 ක ගාස්තද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්තාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.360,508 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.6 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.3,615,822 ක් පළාත් සභාවෙන්ද රු.177,000 ක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගෙන්ද ලැබිය යුතුව තිබුණි.

2.2.7 කඩකාමර කුලී

දකුණු පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2010 දෙසැම්බර් 27 දින අංක 2010/01 දරන චක්‍රලේඛය පරිදි කඩබඳු ගිවිසුම් වසර තුනෙන් තුනට යාවත්කාලීන කිරීම, කඩකාමර කුලිය වසර 05 කට වරක් තක්සේරු කිරීම සිදුව නොතිබූ අතර 2011 ජූනි 30 දිනට කඩකාමර 50 කින් රු.444,054 ක් හිඟහිට තිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම හා අදාල විචලනයන්ද පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 14,653 | 15,327 | (674) | 15,180 | 13,232 | 1,948 |
| අනෙකුත් | 7,005 | 7,480 | (475) | 6,733 | 4,856 | 1,877 |
| උප එකතුව | 21,658 | 22,807 | (1,149) | 21,913 | 18,088 | 3,825 |
| ප්‍රාග්ධන වියදම | 19,503 | 19,503 | - | 30,545 | 29,130 | 1,415 |
| මුළු එකතුව | 41,161 | 42,310 | (1,149) | 52,458 | 47,218 | 5,240 |

2.4 මානව සම්පත් කළමනාකරණය.

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතියික | 11 | 15 |
| ප්‍රාථමික | 24 | 16 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 46 |
| එකතුව | 36 | 78 |

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා රු.15,327,057 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුනේ ඉන් රු.10,277,150 ක් පමණි. මේ අනුව රු.5,049,907 ක් වූ වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 දරණ චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවා ගැනීම අත්හටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 46 දෙනෙක් ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන රු.4,000,884 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛයේ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකල හොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

රු.1,200,000 ක් වටිනාකමට උඩුකාව යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය විසින් 2009 දී තක්සේරු කරන ලද බැකෝ යන්ත්‍රය භාවිතයට ගැනීමකින් තොරව අංගනයේ ගාල් කර තිබුණි.

2.5.2 ලැබිය යුතු ගිණුම්.

සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබුණු ගිණුම් ශේෂයන්හි එකතුව රු.497,406 ක් විය.

2.5.3 අයවීමට ඇති සේවක ණය.

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය සහ අත්තිකාරම් ශේෂවල එකතුව රු. 784,741 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ18 ක එකතුව රු. 69,512 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2.6.1 වීථිපහන් නඩත්තුව.

සමාලෝචිත වර්ෂයේ වීථි පහන් නඩත්තුව සඳහා රු.723,732 ක මුදලක් සභාව වැයකර තිබුණ අතර ලංකා විදුලි බල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය තිබුණේ ඉන් රු.44,064 ක් පමණක් වූයෙන් වෙනස වූ රු.679,668 ක මුදල සභාවට වැය බරක් වී තිබුණි.

2.6.2 ගොඩනැගිලි අයදුම්පත්‍ර - අංක 2011/31

2011 සැප්තැම්බර් 23 දින පරීක්ෂා කරන ලද ඉහත ගොඩනැගිලි අයදුම්පත සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගොඩනැගිලි අයදුම්පතට අදාල තෙමහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල සංවර්ධන බල පත්‍රයකින් තොරව ඉදිකර තිබුණි.

(ii) වර්ග මීටර් 239.49 කින් යුත් තෙමහල් ගොඩනැගිල්ල වහල මට්ටම දක්වා ඉදිකර තිබුණෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නාගරික සංවර්ධන හා පූජා භූමි

සංවර්ධන අමාත්‍යවරයාගේ නිවේදනයේ 6 (ii) වගන්තිය පරිදි ආවරණ අනුමැතිය දීමේදී රු.239,490 ක ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(iii) 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයාගේ නිවේදනයෙහි 26(1) වගන්තිය පරිදි ඉඩමේ මායිම් හා ගොඩනැගිල්ල අතර මීටර් 3 කට නොඅඩු විවෘත ඉඩකඩක් තිබිය යුතු වුවද භෞතිකව තිබුනේ මීටර් 1.3ක් පමණි. කඹුරුපිටිය මුලටියන බී කාණ්ඩයේ මාර්ගයේ පිහිටි මෙම ගොඩනැගිල්ලේ,ගොඩනැගිලි සීමාව මීටර් 12 ක් තිබිය යුතු වුවද භෞතිකව තිබුණේ මීටර් 8.1 ක් පමණි. ගොඩනැගිල්ල පිටුපස ජලය ගලා බසින ඇල සඳහා ඇල රක්ෂිතයක්ද තබා නොතිබුණි.

(iv) ඉහත කරුණු අනුව නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යවරයා හා පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් පනවා ඇති රෙගුලාසි වල විධිවිධානවලට අනුකූලව මෙම ගොඩනැගිල්ල ඉදිකර නොතිබූ බව නිරීක්ෂණය විය.

2.7 කොන්ත්‍රාත් පාලනය

මගනැගුම ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන

(i) සභා බල ප්‍රදේශයේ මගනැගුම ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන යටතේ සංවර්ධනය වූ ඉහල ගෙදර මාර්ගය, ධම්මාලෝක මාවත II අදියර, බොරළු කැටිය හන්දිය සිට ගනේගම තිප්පලහේන මාර්ගය, උල්ලල අලකොලමුල්ල යන මාර්ගවල අන්තර් සම්බන්ධිත කුට්ටිගල් යෙදීමේදී ගල් අතර පරතරය මිලිමීටර් 10 ක් වූ අතර, මහා මාර්ග අමාත්‍යාංශ ලේකම්වරයාගේ 2010 වර්ෂය සඳහා ප්‍රතිපාදන අනුමත කරන උපදෙස් ලිපිය පරිදි එකී මාර්ගවල කොන්ක්‍රීට් කුට්ටිගල් 11000 ක ප්‍රමාණය අතුරා නොතිබුණි.

(ii) මෙම මාර්ග 04 සම්බන්ධයෙන් 2011 සැප්තැම්බර් 28 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී රු.157,963 ක් වටිනා කොන්ක්‍රීට් කුට්ටිගල් 5,447 ක් අඩුවෙන් අතුරා තිබූ බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ගබඩා පාලනය